Faculty of Social
Sciences
University of Kelaniya
Sri Lanka

# නාගරික ජනතාවගේ අධ්‍යාපන මට්ටම සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ දක්වන ආකල්ප පිළිබඳ අධ්‍යයනය

**ටී. එන්. චානක**[1]

**එම්. ජී. කුලරත්න**[2]

## සංක්ෂේපය

පරිසර විනාශය වර්තමානයේ කතාබහට ලක් කෙරෙන ප්‍රධාන මාතෘකාවකි. පාරිසරික විනාශවීම් කෙරෙහි බලපාන ප්‍රධාන සාධක රැසකි. ඒ අතුරින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය හේතුවෙන් සිදුවන පාරිසරික බලපෑම ප්‍රධාන වේ. ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය යනුවෙන් හඳුන්වනුයේ ඉවතලන පරිගණක, ජංගම දුරකථන, රූපවාහිණී, ගුවන් විදුලි යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, විදුලි බල්බ, බැටරි ආදී ගෘහ විදුලි උපකරණ මෙන්ම කාර්යාල හා ව්‍යාපාරයන්හි භාවිතයෙන් ඉවත් කරන විදුලි උපකරණ ද වේ. මේ සම්බන්ධව මේ රට තුළ පර්යේෂණයක් 2009 වසරේ දී මධ්‍යම පරිසර අධිකාරීය විසින් සිදු කර ඇතැත්, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි ජනතාවගේ දැනුවත්භාවය පිළිබඳ මෙතෙක් කිසිදු පර්යේෂණයක් සිදු කර නොමැත. එසේ හෙයින් ජනතාවගේ අධ්‍යාපන මට්ටම, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය කෙරෙහි බලපාන්නේ කොතෙක් ද යන්න මෙම පර්යේෂණය විග්‍රහ කර ඇත. පර්යේෂණය සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වේවැල්දුව ග්‍රාම නිලධාරි වසම තෝරා ගත් අතර, පර්යේෂණය සිදු කිරීමේදී ප්‍රාථමික දත්ත ලබා ගැනීමට ක්ෂේත්‍ර අධ්‍යයනයක් සිදු කළ අතර, ද්විතික දත්ත ලබා ගැනීම විෂය ගත සාහිත්‍ය විර්ශනයෙන් සිදු කරන ලදි. ක්ෂේත්‍ර අධ්‍යයනයෙන් ලබා ගත් තොරතුරු බොහොමයක් ගුණාත්මක දත්ත වන බැවින් විචල්‍යයන් අතර සම්බන්ධතාව විශ්ලේෂණය කිරීමට ප්‍රධාන වශයෙන් කයි වර්ග පරික්ෂාව ද, ලබා ගත් ප්‍රතිඵල වල සම්බන්ධතාවන්හී ප්‍රබලතාව මැනීම සඳහා ක්‍රැමර්ගේ වී අගය පරික්ෂාවද භාවිත කෙරිණි. එමෙන්ම ද්වීමය විචල්‍යයන් පාරායත්ත විචල්‍යය ලෙස යොදා ගනිමින් ද්වීමය ප්‍රතිපායන ආකෘතියද යොදා ගැනිණි. දත්ත විශ්ලේෂණයේදී පැහැදිලි වූ කරුණ නම් ඉහළ අධ්‍යාපනයක් ලබා ඇති පිරිසගේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පිළිබඳව යම් මට්ටමක හෝ දැනුවත් බවක් ඇති බවත්, අඩු අධ්‍යාපන මට්ටමක් සහිත පිරිසගේ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය පිළිබඳ දැනුවත් භාවය පහළ මට්ටමක පවතින බවත්ය. ඒ අනුව නිගමනය කළ හැක්කේ පාසල් විෂය මාලාවලට ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පාඩම්මාලා එකතු කරමින් ඒ පිළිබඳ දැනුවත් භාවය ඉහළ දැමීම සඳහා පාසල් අධ්‍යාපන ක්‍රමය සකස් විය යුතු බවයි.

ප්‍රමුඛ පද; පරිසර විනාශය, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණය, අධ්‍යාපනය, පැසල් විෂය

*1. සමාජ සංඛ්‍යානය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*